# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1786/4 - 2012 නොවැම්බර් මස 26 වැනි සඳුදා - 2012.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය : 01/10/03/04.

### ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාතේ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත් කිරීම්

ඌව පළාත් ආණ්ඩුකාරවර කළුවාදේවගේ නන්ද මැතිව් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ 154ඊ ව්‍යවස්ථාවේ (4) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත් කිරීම කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

01. ඌව පළාත් සභාවේ යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලිබල හා බලශක්ති සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍ය ගරු අ. අකලන් සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා.

ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍ය ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා 2012.11.19 වැනි දින සිට විදේශ ගත වන හෙයින් එදින සිට යළි ශ්‍රී ලංකාවට පැමිණෙන තෙක්, ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය ධුරයේ සහ යථෝක්ත විෂය භාර අමාත්‍ය ධුරයේ වැඩ බැලීමට.

සී. නන්ද මැතිව්,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2012 නොවැම්බර් මස 19 වැනි දින,
බදුල්ල,
රජ වීදියේ පිහිටි,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

12- 287

1A - PG 001461 — 350 (2012/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.